# ජේසුස් වහන්සේගේ ප්‍රාතිහාර්යයන් කිහිපයක්



පරිවර්තනය - www.subaasna.com

ජේසු තුමා ගොඩක් ප්‍රාතිහාර්යය කළා. මේ ප්‍රාතිහාර්යය තුලින් ජේසු තුමා
පෙන්නුවා ජේසු තුමා දෙවියන් වහන්සේගේ පුත්‍රයා කියල.
ජේසු තුමා කරපු පළවෙනි ප්‍රාතිහාර්යය කලේ විවාහ මංගල්‍යය
උත්සවයකදී. ඒ විවාහ මංගල්‍යයේදී අවශ්‍ය මිදියුෂ ඉවර උනා.



5.1

මරියතුමී ජේසු තුමාට මේ ප්‍රශ්නය ගැන කිව්වා. ඒ එක්කම ජේසු තුමා කියන ඕන
දෙයක් කරන්න කියල එතන හිටිය සේවකයින්ට මරිය තුමිය කිව්වා.



5.2


හැම භාජනයක්ම වතුර වලින් පුරවන්න කියල ජේසු තුමා
එතන හිටිය සේවකයින්ට කිව්වා.
වතුර කියල ඔවුන් ඇහුවා. ඔව් වතුරෙන් පුරවන්න කියල
ජේසු තුමා ඔවුන්ට කිව්වා.
5.3


ඊට පස්සේ ජේසු තුමා මේ වතුර
මිදියුෂ බවට පත් කළා. ඒ මිදියුෂ
වලින් ටිකක් අරන් ගිහින්
සංවිධායකට දෙන්න කියල
ජේසු තුමා කිව්වා. ඔහු ඒවා ටිකක්
බීලා කිව්වා හොදම මිදියුෂ මේ
තියෙන්නේ කියල.
ඇයි මේ හොදම මිදියුෂ
මුලින්ම දුන්නේ නැත්තේ
කියලත් ඇහුවා.
5.4

සේවකයෝ ගොඩක් පුදුම උනා.
මේ වගේ දෙයක් නම් සාමාන්‍ය
මිනිසෙක්ට කරන්න බැහැ
කියල ඔවුන් කිව්වා.




5.5

ජේසු තුමා කරපු තව ප්‍රාතිහාර්යයක් තමයි මේ.
එක දවසක් ජේසු තුමා ගෝලයොත් එක්ක
පේදුරු තුමාගේ ගෙදරට ගියා.
පේදුරු තුමාගේ නැන්දම්මාට උණ රෝගය හැදිලා තිබුනා.



5.6

ජේසු තුමා ඇගේ අත අල්ලලා ඇයව සුව කලා.
සුවය ලැබූ ඇය ජේසු තුමාටත්, ගෝලයින්ටත්
උපස්ථාන කරන්න පටන් ගත්තා.



5.7

තවත් දිනක් නගරයේ ගොඩක් දෙනෙක්
ජේසු තුමාව හම්බ වෙන්න ආවා.
ඒ අතර අන්ධ, ගොළු, බිහිරි, යක්ෂාවේශ
වුන අය ගොඩක් එක්කගෙන ආවා
ජේසු තුමාගේ පිහිට ඉල්ලගෙන.



5.8

ජේසු තුමෙනි , දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෙනි අපිට උදව් වෙන්න කියලා ඉල්ලුවා. ජේසු තුමා ඒ අයට පිහිට උනා. ඒ අතර හිටියා ඇවිදින්න බැරුව කිහිලිකරු වලින් ආපු අය. එයාල ඇවිදින්න පටන් ගත්තා.



5.9

ඒ අතර ලාදුරු වගේ දරුණු රෝග වලින් පෙලෙන අයත් හිටියා.




5.10



ජේසු තුමා ඔවුන්වත් සුව කළා

5.11

ඒ අතර යක්ෂාවේශ උන අය හිටියා. ජේසු අණකලා ඒ යක්ෂයින්ට ඔවුන්ගෙන් ඈත්වෙලා යන්න. ජේසුගේ අණට අවනත වෙලා ඒ යක්ෂයින් ඔවුන්ව හැර ගියා.



5.12


මේ අතර මිනිස්සු හතරදෙනෙක් අසනීප වෙච්ච යාළුවෙක්ව උස්සගෙන ආවා
ජේසු තුමන්ගෙන් සුවය බලාපොරොත්තුවෙන. ඒත් සෙනග ගොඩ හින්ද
එයාලට ජේසු තුමන් ගාවට ලං වෙන්න බැරි උනා.
5.13


කරන්න දෙයක් නැති උන මේ යහළුවෝ
හතර දෙනා ජේසු තුමන් හිටිය තැන උඩ
වහලේ ගලවල උඩ ඉදන් මේ අසනීප වෙච්ච
යහළුවව ජේසු තුමන් ගාවට ගෙනාව.
5.14

මේ යහළුවන්ගේ තිබුන විශ්වාසය
ජේසු තුමන් දැක්කා. ජේසු තුමන්
ඒ රෝගී යහළුවට කිව්වා ඔබේ
පව් ඔබට කමා කලා,
මේ පැදුරත් අරගෙන යන්න
කියල. ඔහු සුව වෙලා නැගිටලා
පැදුරත් අරගෙන ගියා.




5.15

දවසක් ජේසු තුමන් ගෝලයිනුත් එක්ක
ඔරුවක යමින් හිටියා. ජේසු තුමා ඔරුවේ
නිදාගෙන හිටියේ. මේ අතර මුහුදේ විශාල
කුණාටුවක් ඇති උනා. ගෝලයෝ බය වෙලා
ජේසු තුමන්ට කිව්වා අනේ ස්වාමිනි අපිව
බේර ගන්න කියල.



5.16

ජේසු තුමන් නැගිටලා කුණාටුවට
නවතින්න කියල අණ කළා.
කුණාටුව ඒ වෙලාවෙම නැවතුනා.
සොබාධර්මය පවා ජේසු තුමන්ට
අවනත වෙනවා කියල
ගෝලයෝ කිව්වා.



ජේසු තුමන් කරපු ප්‍රාතිහාර්යය බලන් හිටිය
ගෝලයෝ ජේසු තුමන් දෙවියන් වහන්සේගේ
පුත්‍රයා කියන එක විශ්වාස කළා.
ගෝලයෝ පුදුම වෙලා හිටියේ.

5.17